# info-NDRSC

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ත්‍රෛමාසික නිල පුවත් සඟරාව 2025 මාර්තු

ISSN: 3084 - 9209



**අකුණු අනතුරුවල කාලීන හා අවකාශීය ව්‍යාප්තිය**



**ඩිජිටල් දත්ත කළමනාකරණය හා ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය**

**අනුශාසක:**
කේ.ජී. ධර්මතිලක
අතිරේක ලේකම්

නාමල් ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

**සංස්කාරක:**
රන්ජිත් වීරසේකර
සංඛ්‍යාලේඛන නිලධාරි

**සහය සංස්කාරක:**
දීපානි වටගොඩගෙදර
චාමික මදුසංක
තරිදු සිල්වා
සචිනි වීරසිංහ
නිලංකා සුදර්ශනී

වර්ෂ 1996 දී ආපදා කළමනාකරණ හා සහන සේවා සැපයීමට ආයතනික ව්‍යුහයක් නොමැතිවීම හේතුවෙන් එයට පිළියමක් ලෙස **ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (NDRSC),** සමාජ සේවා හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නමින් ස්ථාපිත කරන ලදි.

අංක 1422/22 හා 2005.12.08 දිනැති ගැසට් නිවේදනය මඟින් ආපදා කළමනාකරණය හා පසු ආපදා සහන සේවා සැපයීම සඳහා පිහිටුවන ලද ආපදා සහන සේවා අමාත්‍යාංශය යටතට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය පත්කොට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සහන සේවා නිලධාරීන් පත්කරන ලදි. මෙම නිළධාරීන් ගංවතුර, නායයෑම්, සුළි සුළං ආදී ස්වභාවික ව්‍යසනයන් මඟින් මෙන්ම විශේෂිත ආපදා අවස්ථාවන්හීදී ද සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි නිරත වෙමින් ජාතික වගකීම ඉටුකරනු ලබයි.

මෙම කාර්යයන් ඉටුකිරීම සඳහා 2024 වර්ෂයේදී NDRSC ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් රුපියල් බිලියන 2.1කට ආසන්න මුදලක් වැයකර ආපදාවන්ට ලක්වූ ජනතාවගේ ජීවන තත්ත්වය යලි නගාසිටුවීමට කටයුතු කරන ලදි.




## දෛනික ආපදා සිද්ධි වාර්තාකරණයේ ඩිජිටල් ප්‍රවේශය

ස්වභාවික ආපදා හේතුවෙන් පීඩාවට පත්වන පවුල් හා හානියට පත්වන දේපළ පිළිබඳව සංඛ්‍යාත්මක දත්ත රැස්කිරීමේ හා නිකුත්කිරීමේ වර්තමාන සාමාන්‍ය ක්‍රියාවලිය ඩිජිටල් පරිවර්තනයකට ලක් කරමින් info-NDRSC ආපදා ආශ්‍රිත මාර්ගගත දත්ත පද්ධතිය එළිදක්වන ලදි.
විධිමත් හා කඩිනම් සහන සේවා සැපයීමටත්, හානිපූර්ණයට අවශ්‍ය නිල සංඛ්‍යාලේඛන හා දත්ත ලබාගැනීමටත්, පර්යේෂකයන් ඇතුළු අනෙකුත් සියලු පරිශීලකයන්ට අවශ්‍ය තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශවීමටත් මෙමඟින් අවස්ථාව සැලසේ.

මෙහිදී දත්ත රැස් කිරීම, සැකසීම, විශ්ලේෂණය කිරීම සහ දත්ත නිකුත් කිරීම සම්බන්ධ තාක්ෂණික සහය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික සංඛ්‍යාලේඛන සංවර්ධන වැඩසටහනට සමගාමීව දත්ත හා තොරතුරු ප්‍රමිතිකරණ ක්‍රමවේදයන්ට හා සත්‍යාපන ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකර ඇත.
මෙම info-NDRSC දත්ත පද්ධතිය සංවර්ධනය සඳහා මූල්‍ය අනුග්‍රහය “Save the Children” ආයතනය ද තාක්ෂණික සහය “GIS Solutions (Pvt) Ltd” ආයතනය මඟින් ද සැපයේ.



**නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමාගේ පණිවිඩය**

වර්තමානය වනවිට ගංවතුර, නායයාම් සහ නියඟය ආදී ආපදා තත්ත්වයන් ඉතා සුලභ සිදුවීම් බවට පත්ව තිබේ. මෙම ආපදා තත්ත්වයන් හේතුවෙන් පීඩාවට පත්වන ජනතාව වෙනුවෙන් සහන සේවා සැපයීම, ජන ජීවිත යළි නගාසිටුවීම සඳහා සහය වීම රජයේ මූලික වගකීමකි. එහිදී සහන සේවා සැපයීමට අදාළ තොරතුරු නිවැරදි ලෙස සියලුම පාර්ශව වෙත සැපයීම කාලීන අවශ්‍යතාවකි.

මේ සඳහා ගනු ලබන උත්සාහයක් ලෙස ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ඩිජිටල් හා මුද්‍රිත මාධ්‍යයෙන් නිකුත් කරනු ලබන මෙම ත්‍රෛමාසික සඟරාවෙහි මංගල කලාපයට මාගේ හදපිරි සුභ පැතුම් එක්කරමි.

මේජර් ජෙනරාල් අරුණ ජයසේකර (විශ්‍රාමික)
නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය



**අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය**

දේශගුණික විපර්යාසයන්ට සමගාමීව ස්වභාවික ආපදා තත්ත්වයන්ගේ වර්ධනයක් වර්තමානය වන විට නිරීක්ෂණය වේ. එලෙස ආපදාවන්ට මුහුණ දෙන ජනතාව වෙත සහන සැලසීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම අප අමාත්‍යාංශයේ ප්‍රමුඛ වගකීමකි. එම වගකීම ඉටු කිරීමේදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ඉටු කරනු ලබන සේවාවන් පිළිබඳ ත්‍රෛමාසික සඟරාවක්, ඩිජිටල් සහ මුද්‍රිත මාධ්‍යයෙන් නිකුත් කිරීම අගය කරමි.

එමෙන්ම, මෙහි අඩංගු දත්ත සහ තොරතුරු සමාන්‍ය ජනතාව, පර්යේෂකයින්, විශ්වවිද්‍යාල සිසුන් ආදී සියලු පාර්ශවයන්ට වඩාත් පහසුවෙන් ප්‍රවේශ වීමට හා භාවිතයට ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. එබැවින් මෙම ත්‍රෛමාසික සඟරාව නිකුත් කිරීම පිළිබඳව ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සියලු නිලධාරීන්ට සුබ පැතුම් එක් කරන අතර මෙම කටයුතු ඉදිරියේදී තවදුරටත් සාර්ථක කරගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා
(විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයන-චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය



**අතිරේක ලේකම්තුමාගේ පණිවිඩය**

ආපදා කළමනාකරණ අංශය යටතට ගැනෙන ප්‍රධාන වගකීම් දරණ ක්ෂේත්‍ර අතුරින් සහන සේවා සැපයීමට හිමිවනුයේ ඉහළ ප්‍රමුඛතාවයකි. වර්තමානයේදී ආපදා සිද්ධි වාර්තාවීමේ ඉහළ ප්‍රවණතාවයක් දැකිය හැකි බැවින් කාර්යක්ෂම සහන සේවා සැපයීමේ ක්‍රියාවලියක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. එම කාර්යය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට අවැසි තොරතුරු මාර්ගගත දත්ත පද්ධතියක් මඟින් එළි දැක්වීම පිළිබඳව අතිශයින් සතුටු වෙමි. මෙම පද්ධතිය හරහා ලබා ගන්නා දත්ත ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ පර්යේෂකයන් ඇතුළු අනෙකුත් පාර්ශවයන්ට මහත් පිටුවහලක් වනු ඇත.

මෙම දත්ත විශ්ලේෂණයෙන් ගනු ලබන තීරණ පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහාත් එම දැනුවත්වීමෙන් සිදුවන චර්යාත්මක වෙනස මඟින් ආපදා අවධානම අඩුකිරීම තුළින් සහන සේවා සැපයීම සඳහා වන පිරිවැය අවම කිරීම සහ ජාතික ආර්ථිකයට වන බලපෑම අඩුකිරීමට උපකාරී වනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

ඉදිරියේදී මෙම සඟරාව සඳහා විද්වතුන් ඇතුළු අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ ලිපි හා අත්දැකීම් හුවමාරුව ඔස්සේ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා ඉහළ දායකත්වයක් දක්වන සඟරාවක් බවට පත්වීමට මගේ සුභ පැතුම් එක් කරමි.

කේ.ජී.ධර්මතිලක
අතිරේක ලේකම් - ආපදා කළමනාකරණ අංශය
ආරක්ෂක අමාත්‍යාංශය



# අකුණු අනතුරුවල කාලීන හා අවකාශීය ව්‍යාප්තිය

ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ප්‍රධානතම අකුණු අනතුරු සහිත රටක් වන අතර අකුණු මඟින් වසරකට දළ වශයෙන් 50 දෙනෙකු පමණ මියයයි (Gomes & Ahkadir,2011). අකුණු ස්ථානීය දත්ත පිළිබඳ ෆින්ලන්ත කාලගුණ විද්‍යා ආයතනය සහ Vaisala Inc සමඟ ඒකාබද්ධව සිදුකළ ශ්‍රී ලංකාව සඳහා වන දැඩි කුණාටු අනතුරු ඇඟවීමේ සහයෝගීතා සේවා ව්‍යාපෘතිය (SSWSS) මඟින් ශ්‍රී ලංකාව තුළ අකුණු ක්‍රියාකාරකම්වල අවකාශීය සහ කාලීන විචල්‍යතාව 2015 සිට 2018 දක්වා GLD360 අකුණු ස්ථාන දත්ත කිලෝමීටර් 2 × 2 ජාලකය තුළ අධ්‍යයනය කර ඇත. (I. M. Shiromani Priyanthika Jayawardena & Antti Mäkelä - 2021)




මූලාශ්‍රය: I. M. Shiromani Priyanthika Jayawardena & Antti Mäkelä - 2021

අකුණු ක්‍රියාකාරකම්වල වාර්ෂික සහ සෘතුමය අවකාශීය ව්‍යාප්තිය නිරූපණය කිරීම සඳහා ඉහත දත්ත උපයෝගී කරගනිමින් සිදුකළ අධ්‍යයනය මඟින් 2015 සිට 2018 දක්වා කාලය සඳහා වාර්ෂික මධ්‍යන්‍ය අකුණු වේගය මධ්‍යම කඳුකරයේ බටහිර කඳු පාමුල පිහිටි ප්‍රදේශයක උපරිම වන අතර මධ්‍යම කඳුකරයේ ඉහළ උන්නතාංශයක දී අඩු වන බව හෙළිවී ඇත.

මෙම අධ්‍යයනයට අනුව ඉහළම වාර්ෂික සාමාන්‍ය අකුණු ප්‍රමාණය කෑගල්ල සහ ගම්පහ දිස්ත්‍රික්කවල දක්නට ලැබේ. සෘතුමය වශයෙන්, පළමු අන්තර් මෝසම් සමයේදී (මාර්තු සිට අප්‍රේල් දක්වා) සහ දෙවන අන්තර් මෝසම් සමයේදී (ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා) වැඩිම අකුණු ඇතිවීමේ ද්වි-ආකෘති රටාවක් දෘශ්‍යමාන වන අතර අඩුම අකුණු ප්‍රමාණය ඊසාන දිග මෝසම් සමයේදී නිරීක්ෂණය වේ.

පළමු අන්තර් මෝසම් සමය තුළ අප්‍රේල් මාසයේදී උපරිම අකුණු සංඛ්‍යාවක් නිරීක්ෂණය වන බව මාසික විචල්‍යතාවයෙන් පෙන්නුම් කරයි. මෙම අධ්‍යයනයේ විශ්ලේෂණය මඟින් ශ්‍රී ලංකාවේ දේශගුණික කාල හතර තුළ අකුණු ක්‍රියාකාරකම්වල අවකාශීය සහ තාවකාලික රටාව පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු සපයන අතර, ප්‍රතිඵල විශේෂයෙන් තීරණ ගැනීමේදී සහ අකුණු අවදානම් අවම කිරීම සඳහා භාවිතා කළ හැකිය.




වසර 2020 සිට 2024 දක්වා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් රැස්කරන ලද අකුණු හේතුවෙන් සිදුවූ අනතුරු පිළිබඳ දත්ත මඟින්ද ඉහත අධ්‍යනයේදී පෙන්වා දී ඇති ශ්‍රී ලංකාවේ අකුණු ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු තවදුරටත් සත්‍යාපනය වේ. විශේෂයෙන්ම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සතු අකුණු අනතුරු හේතුවෙන් සිදුවූ මරණ පිළිබඳ දත්තයන්ට අනුව ලංකාවේ උතුර,උතුරු මැද හා නැගෙනහිර යන ප්‍රදේශ ආශ්‍රිතව වැඩි වශයෙන් මරණ වාර්තා වී ඇති බව නිරීක්ෂණය වේ.




2020 – 2024 යන වසර පහ තුළ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත වාර්තා වූ අකුණු ගැසීම් හේතුවෙන් සිදුවූ මරණ පිළිබඳ අවකාශීය දත්ත විශ්ලේෂණයේ තොරතුරු මෙහි දැක්වේ.

| දිස්ත්‍රික්කය | මරණ සංඛ්‍යාව | දිස්ත්‍රික්කය | මරණ සංඛ්‍යාව |
|---|---|---|---|
| අම්පාර | 6 | කුරුණෑගල | 5 |
| අනුරාධපුර | 14 | මන්නාරම | 2 |
| බදුල්ල | 2 | මාතලේ | 2 |
| මඩකලපුව | 4 | මාතර | 4 |
| කොළඹ | 1 | මොනරාගල | 6 |
| ගාල්ල | 4 | මුලතිවු | 3 |
| ගම්පහ | 2 | පොළොන්නරුව | 8 |
| හම්බන්තොට | 7 | පුත්තලම | 10 |
| යාපනය | 2 | රත්නපුර | 13 |
| කළුතර | 3 | ත්‍රිකුණාමලය | 8 |
| කෑගල්ල | 6 | වවුනියා | 2 |

මෙම දත්ත පිළිබඳ අවධානයෙදී සිදු වූ මුළු මරණ අතුරින් 80%ක් පිරිමි පුද්ගලයන් වීම දැකිය හැක.




එසේම ලංකාව තුළ අකුණු ගැසීම් වැඩි සනත්වයක් ඇති ප්‍රදේශයන් හා සැසඳීමේදී වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ අනුරාධපුරය, රත්නපුර, පුත්තලම හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික් වලිනි. මෙම ප්‍රදේශ වැඩි ප්‍රමාණයක් තැනිතලා ප්‍රදේශ වීමත් ගොවිතැන වැඩි පිරිසකගේ ජීවනෝපාය වීමත් අවධානයට ලක්විය යුතු කරුණකි. ඒ අනුව මෙම මරණ සිදුවීම රටේ ආර්ථිකයට බලපෑම් ඇතිකිරීමට හේතුවනවා මෙන්ම සාමාජීය ගැටලු ඇති වීමටද හේතු වී ඇත.




ස්වභාවික ආපදා හේතුවෙන් වන මරණ අතරින් අකුණු ගැසීම් හේතුවෙන් සිදුවන මරණ පහසුවෙන් වළක්වා ගතහැකි වුවද ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොමැත.එසේම **"හෙණ ගහන්න තරම් අපරාධයක් අපි කරලා නැහැ"** යන ජන ව්‍යවහාරය මගින් පෙනී යන්නේ අකුණු ගැසීම සමඟ පුද්ගල චර්යාවන්හි සම්බන්ධයක් ඇති බවට මතයක් සමාජයේ පවතින බවයි.



මෙම මරණ සංඛ්‍යාව අවම කිරීම සඳහා අකුණුවලින් වැළකීමට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වේ. එසේම අකුණු අනතුරු වැඩිවන කාල වකවානු පිළිබඳව අවධානය යොමුකර එම කාලය තුළදී මෙම දැනුවත් කිරීම් වැඩි කිරීමද මරණ සංඛ්‍යාව අඩු කිරීමට උපකාරී වේ. එබැවින්, සමාජයක් ලෙස මෙම තොරතුරු ජනතාව වෙතට ගෙන යාම අප සියලු දෙනාගේම වගකීමක් වන අතර එතුළින් අකුණු හේතුවෙන් සිදුවන මරණවලින් තොර රටක් නිර්මාණය කිරීමට හැකිවනු ඇත.

නාමල් ලියනගේ - ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්
වාමික මදුසංක - සහන සේවා නිලධාරී

# ඩිජිටල් දත්ත කළමනාකරණය හා ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය

ලොව පුරාම විද්‍යාත්මක හා ඩිජිටල් තීරණ ගැනීම සඳහා දත්ත වල අවශ්‍යතාව වැඩිවෙමින් පවතී. දැනට දශක තුනකට පමණ පෙර සිට ICT යන ඉංග්‍රීසි අකුරු තුන ජනගත වූ අතර Information Communication Technology (තොරතුරු සන්නිවේදන තාක්ෂණය) අනුව මනුෂ්‍ය වර්ගයා තම කටයුතු වලදී තීරණ ගන්න ආකාරය මෙන්ම ඔවුන්ගේ සාමාන්‍ය දින චර්යාව පවා වෙනස් විය.
පසුගිය දශක කීපය තුළ ඉතා සීග්‍රයෙන් වර්ධනය වුණු ජංගම දුරකථන තාක්ෂණය දත්ත හුවමාරුවට, පරිශීලනයට හා විශ්ලේෂණයට පිටුවහලක් වූ සේම, ඇතැම් විට පරිශීලකයා ජංගම දුරකතනයේ 'වහලෙකු' කරවීමට තරම් එම තාක්ෂණය වර්ධනය විය. ඒ කෙසේ වෙතත්, දහනමවන හා විසිවන සියවස් වල සිදුවූ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය සේම, දත්ත හා දත්ත හුවමාරු පද්ධති වල සිදු වූ සුවිශේෂී වර්ධනය මනුෂ්‍ය වර්ගයා හා ඔවුන්ගේ පාරිසරික පද්ධති වල යහ පැවැත්ම සඳහා වැදගත් වී ඇතැයි කිවහොත් නිවැරදිය.

ලොවපුරා (2024 දී) දත්ත කළමනාකරණයට පහසුකම් සලසන 'ස්මාර්ට්' ජංගම දුරකථන බිලියන 7.2 ක් භාවිතා වූ අතර මේ අනුව ලොව

ජනගහනයෙන් 69% ළඟ දත්ත කළමනාකරණ හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 72% (2019) අන්තර්ජාලය හා එක්වෙන අතර එයින් අතිමහත් බහුතරයක් ජංගම දුරකථනය හරහා අන්තර්ජාලය භාවිතා කරයි.



වත්මන් සංවර්ධනයේ හා මනුෂ්‍ය යහපැවැත්මේ අත්‍යවශ්‍යම අංගයක් ලෙසින් ආපදා කළමනාකරණය, නිවැරදි හා කාලීන දත්ත මත පදනම් ව තීරණ ගැනීමේ අවශ්‍යතාව ඉහළින් දැනෙන ක්ෂේත්‍රයකි. ඵලදායී ආපදා කළමනාකරණයක් සඳහා අවදානම් හඳුනාගැනීම, අවදානමට සූදානම් වීම, ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම සහ යථා තත්ත්වයට පත් කිරීම දක්වා විවිධ අදියරයන් ආපදා දත්ත කළමනාකරණය විසින් ආවරණය කරයි.
දත්ත උපයෝගී කරගෙන, උපද්‍රව සිතියම්ගත කිරීම, ප්‍රජා පැතිකඩ සකස්කරගැනීම, යටිතල පහසුකම් වල විස්තර, ජනගහන ඝනත්වය හා ජනගහනය සම්බන්ධ තොරතුරු, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් තොරතුරු, සම්පත්, සහ ප්‍රතිසාධන උත්සාහයන් යනාදී ආපදා අවදානම් කළමනාකරණයේ සියලුම අංග සඳහා මේ වන විට දත්ත කළමනාකරණය භාවිත වෙයි. මේ සඳහා විවිධ ආයතන තම දත්ත හැසිරවීමේ පද්ධති නවීකරණය කරමින් සිටියි.



ඉහත සඳහන් කළ ආකාරයෙන්, ජංගම දුරකතන හරහා ආපදා පිළිබඳ දත්ත ද හුවමාරු කරගැනීමට ඇති හැකියාව වර්ධනය වීම මෙරට ආපදා කළමනාකරණය හා සම්බන්ධව හොඳ තත්වයකි. එසේම, ප්‍රාදේශීයව හා ග්‍රාමීය මට්ටමින් සේවයේ යෙදෙන රාජ්‍ය නිලධාරීන් හරහා ආපදා කළමනාකරණයට අදාළ විවිධ දත්ත ලබාගැනීමට ආයතන වලට හැකියාව පවතී.
එම නිසා ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් සහ ආපදා සහන සේවා නිලධාරීන් දත්ත රැස්කිරීමට අවශ්‍ය ඩිජිටල් මෙවලම් හා ඒ සම්බන්ධව පුහුණුව ලබාදී, ඉතා විධිමත්ව හා කාර්යක්ෂමව පහළ සිට මුදුනට එනම්, අවදානම් සහිත ප්‍රජාවන් ගේ සිට වගකිවයුතු රාජ්‍ය ආයතන දක්වා දත්ත ලබාගත හැකිය.
ඒ අනුව ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ජාතික සැලැස්මේ ප්‍රධාන අංගයක් වන ‘අවදානම් සංවේදී ප්‍රාදේශීය සංවර්ධනය’ ට පහසුකම් සැලසෙනු ඇත.



ඒ හරහා ආපදාවක් ඇතිවීමට පෙර උපද්‍රව හඳුනා ගැනීමත් (Hazard Identification), උපද්‍රව වලට නිරාවරණය (Hazard Exposure) වන පිරිස් හඳුනාගැනීමත්, උපද්‍රව නිසා හානියට පත්වියහැකි අසරණ වන හෝ දැඩි බලපෑමට ලක්වන ජනතාව (Vulnerable Population) හඳුනාගෙන වාර්තා කිරීමටත් හැකියාව ලැබේ. එසේම, ආපදා ප්‍රතිචාර හෝ පුනරුත්ථාපනය සඳහා යොදවන මහජන බදු මුදල් හෝ පරිත්‍යාග සඳහා නිසි ආයෝජන - ප්‍රතිලාභ ද ලැබෙනු ඇත.
එසේම පසු ආපදා අවදියේදී පීඩාවට පත්වූවන්, හානි වූ දේපළ, සුරක්ෂිත මධ්‍යස්ථාන ගත වී ඇති පිරිස් ආදී තොරතුරු බිම් මට්ටමේ නිලධාරීන් හරහා කඩිනමින් හා නිරවද්‍යව ලබා ගත හැකිය. මෙම ජාතික අවශ්‍යතාවය සපුරාලමින් දැනට ක්‍රියාත්මක කරනු ලබන සාම්ප්‍රදායික ක්‍රියාවලිය තත්ත්කාලීන දත්ත සමුදායක් (A Real-time Database) බවට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පරිවර්ථනය කරන ලදි.
“Save The Children” ජාත්‍යන්තර ආයතනයේ සහයෝගයෙන් නිමවන ලද එම දත්ත පද්ධතිය මඟින් ලබා ගන්නා තොරතුරු භාවිතයෙන් ආපදා අවස්ථාවන්හිදී වඩා ප්‍රශස්ත විසඳුම් ලබා දීමට හැකි වනු ඇත. තවද, පවතින සීමිත සම්පත් ප්‍රමාණය භාවිතයෙන් සහය අවශ්‍ය ස්ථානයන් වෙත ලබා දීමත්, සියලු පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීමත් මෙම දත්ත සමුදාය ඔස්සේ සිදු කළ හැකි වනු ඇත.
තවදුරටත් පශ්චාත් ආපදා අවස්ථා වලදී පසුවිපරම් කටයුතු වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස සිදු කිරීමට මෙම පද්ධතිය ඉවහල් වනු ඇත. මෙමඟින් ඉදිරි සැලසුම් සකස් කිරීමටත් ආපදා සහන සේවා යාන්ත්‍රණය වඩා විනිවිද බාවයෙන් ඉටු කිරීම තුළින් යහපාලන මූලධර්මයන් ක්‍රියාත්මක කල හැකිය.

මේනක විජේසිංහ - ආපදා කළමනාකරණය සඳහා ජ්‍යෙෂ්ඨ උපදේශක, සේව් ද චිල්ඩ්‍රන් ආයතනය

# අනාරක්ෂාවෙන් සුරක්ෂාවට




පසුගිය දශකය තුළ ඇති වූ ස්වභාවික ව්‍යසනයන්ගෙන් වැඩිම පිරිසකගේ දිවි අහිමි වූ අවාසනාවන්ත ඛේදවාචකයක් ලෙස, 2016 මැයි 17 දින අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එළගිපිටිය ග්‍රාම නිලධාරී වසමේ සිදුවූ සාමසර කන්ද නායයෑම් දැක්විය හැකිය.

මෙම නායයෑම් ආපදා තත්ත්වය හේතුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පවුල් 9,984ක පුද්ගලයින් 36,124 ක් පීඩාවට පත් වූ අතර වාර්තා වූ මරණ සංඛ්‍යාව 52 කි. පුද්ගලයින් 99 ක් අතුරුදහන් ලෙස ද, පූර්ණ නිවාස හානි 178 ක් හා අර්ධ නිවාස හානි 1,654 ක් ලෙස ද වාර්තා විය.

එමඟින් නිවාස අහිමි වූ පවුල් සඳහා සුරක්ෂිත ස්ථානයක නව නිවාස ඉදිකර නැවත පදිංචි කිරීමේ වැඩසටහනක් 2016 වර්ෂයේ ජූනි මස වන විට ආරම්භ කරන ලදි. ඒ යටතේ රු.මි. 2008 ක් වැය කරමින් නිවාස 1,306 ක් ඉදිකර විපතට පත්වූ පවුල් වල ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරන ලදි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ එම පදිංචි කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින අතරතුර නැවතත් 2017 වර්ෂයේ මැයි මස උද්ගත වූ අයහපත් කාලගුණික තත්ත්වයත් සමඟ රත්නපුර, ගාල්ල, මාතර, කෑගල්ල වැනි දිස්ත්‍රික්ක ගණනාවක නායයෑම් හා නායයෑමේ අධි අවදානම් තත්ත්වයන් වාර්තා විය.

එවකට පැවති ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මෙම තත්ත්වයෙහි බැරෑරුම් බව කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර නායයෑම් වලින් සිදුවන ජීවිත හානි අවම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵලයක් ලෙස සාමසර නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය පූර්වාදර්ශයක් කර ගනිමින් නායයෑම් හා නායයෑමේ අධි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කළයුතු ලෙස හඳුනා ගන්නා ලද පවුල් කේන්ද්‍ර කරගනිමින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන හඳුන්වා දෙන ලදි.

වර්තමානය වන විට නායයෑම් අධි අවදානම් ලෙස හඳුනා ගන්නා ලද පවුල් සඳහා සහන සැලසීමට ක්‍රියාත්මක ප්‍රධානතම ජාතික වැඩසටහනක් ලෙස මෙමඟින් පවුල් 4,898 ක් වෙත ප්‍රතිලාභ ලබාදී ඇත.

**නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ හිමිවන ප්‍රතිලාභ**

'නිවසට නිවසක්' යන සංකල්පය අනුව එනම් අධි අවදානම් ස්ථානයේ පැවති නිවස වෙනුවට ආපදාවන්ට ඔරොත්තුදෙන ලෙස සුරක්ෂිත ස්ථානයක නිවස ඉදිකර ගැනීමට හෝ එසේ ඉදිකර ඇති නිවසක් මිලදී ගැනීම සඳහා උපරිමය රු.මි. 1.6 ක මුදලක් පහත පරිදි ලබාදේ.

1. ඉඩමක් සමග නිවසක් මිලදී ගැනීමට රු.මි.1.6
2. ඉඩමක් මිලදී ගෙන නිවස ඉදිකිරීම සඳහා ඉඩමට රු.මි. 0.4 ක් සහ නිවස ඉදිකිරීමට රු.මි.1.2
3. රජයේ ඉඩම් ලබාදී එම ඉඩමෙහි නිවස ඉදිකිරීම සඳහා රු.මි.1.2
4. ප්‍රතිලාභියා සතු වෙනත් ඉඩමක නිවස ඉදිකිරීම සඳහා රු.මි.1.2

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා සුදුසු රජයේ ඉඩම් ප්‍රමාණවත් ලෙස නොමැතිවීම මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඇති මූලික අභියෝගයකි. මෙයට අමතරව ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළයාම, නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉඩම්/ නිවාස මිලදී ගැනීමට හා නිවාස ඉදිකිරීමට ලබාදෙන මුදල් ප්‍රමාණය කාලානුරූපීව සංශෝධනය නොවීම, නව නිවාස ඉදිකිරීමට යොදා ගන්නා රජයේ ඉඩම්වල ජලය, විදුලිය, අභ්‍යන්තර මාර්ග වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා විශාල මුදලක් වැයවීම වැනි කරුණු මෙම වැඩසටහන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට පවතින බාධාවන් වන අතර ආපදා කළමනාකරණ අංශය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය එක්ව මෙම බාධාවන් අවම කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අදාල කටයුතු සිදු කරමින් ඇත.

| දිස්ත්‍රික්කය | ඉදිකර අවසන් නිවාස ගණන | ඉදිකරමින් පවතින නිවාස ගණන | දරණ ලද සමස්ත වියදම (රු.) |
|---|---|---|---|
| රත්නපුර | 410 | 771 | 1,384,632,446.77 |
| කෑගල්ල | 137 | 115 | 344,441,909.61 |
| කොළඹ | 19 | 7 | 21,130,000.00 |
| ගම්පහ | 39 | 0 | 54,135,200.00 |
| කළුතර | 571 | 422 | 1,187,964,229.06 |
| ගාල්ල | 272 | 85 | 489,633,775.36 |
| මාතර | 308 | 101 | 531,614,052.30 |
| හම්බන්තොට | 94 | 7 | 159,212,460.99 |
| මහනුවර | 168 | 301 | 447,906,072.34 |
| මාතලේ | 91 | 62 | 166,626,800.00 |
| නුවරඑළිය | 151 | 158 | 308,577,791.92 |
| මොනරාගල | 27 | 22 | 53,318,900.00 |
| බදුල්ල | 175 | 259 | 417,853,427.99 |
| පොළොන්නරුව | 1 | 50 | 36,570,000.00 |
| කුරුණෑගල | 59 | 16 | 84,075,480.80 |
| **එකතුව** | **2522** | **2376** | **5,687,692,547.14** |



දීපානි වටගොඩගෙදර - ආපදා සහන සේවා නිලධාරි

# ආපදා සම්බන්ධ නිල සංඛ්‍යාලේඛන අවශ්‍ය වන්නේ ඇයි ?

ආපදා කළමනාකරණය යන සංකල්පය තුළින් අද වනවිට ආපදා කළමනාකරණය සහ සහනසේවා සැපයීමට වඩා ආපදා අවදානම අවම කිරීම සහ වැලැක්වීම කෙරෙහි ප්‍රමුඛ අධානයක් යොමුකර ඇත.

මේ සම්බන්ධයෙන් වන ගෝලීය සංවාදය තුළ ප්‍රශස්ථ තීරණ ගැනීමේ පදනම නිවැරදි සහ යාවත්කාලීන කරන ලද දත්ත භාවිතය බව හඳුනාගෙන ඇත. මෙම දත්ත විවිධ ජාතික මෙන්ම ජාත්‍යන්තර සංවිධාන, ආයතන භාවිතා කරන බැවින් ආපදා සම්බන්ධ තත්ත්වයන් රටේ ප්‍රතිරූපය කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකි බැවින් නිවැරදි හා නිල සංඛ්‍යා ලේඛන පවත්වා ගැනීම අනිවාර්ය වේ.
ආපදා කළමනාකරණයට අදාළව එකම සිදුවීමක් සඳහා ආයතන කිහිපයක් විසින් එක්රැස් කර ඇති දත්ත වල විෂමතා ගණනාවක් පෙන්නුම් කරයි. එබැවින්, ආපදා සම්බන්ධ සංඛ්‍යාලේඛන පිළිගත හැකි නිල සංඛ්‍යාලේඛන බවට පරිවර්තනය කිරීම සඳහා දත්ත රැස් කිරීම, සැකසීම සහ බෙදා හැරීම පිළිගත් ජාතික හෝ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිදුකිරීමට අවශ්‍ය වේ.
ආපදා සම්බන්ධ සංඛ්‍යාලේඛන නිල සංඛ්‍යාලේඛන බවට පරිවර්තනය කිරීම සඳහා නිරවද්‍යතාව, විශ්වසනීයත්වය සහ ජාත්‍යන්තර ප්‍රමිති අනුකූලතාව සහතික කිරීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් අවශ්‍ය වේ.
ඒ සඳහා;

**1. දත්ත එකතු කිරීම සහ මූලාශ්‍ර:**

විශ්වාසදායක සහ ප්‍රමිතිගත මූලාශ්‍රවලින් ආපදා සම්බන්ධ දත්ත රැස්කිරීම:

**රාජ්‍ය ආයතන:** ජාතික ආපදා කළමනාකරණ ආයතන (NDMAs), කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, හදිසි ප්‍රතිචාර ඒකක සහ වෙනත් විශ්වාසදායක මූලාශ්‍ර.

**ජාත්‍යන්තර සංවිධාන:** එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම් අවම කිරීමේ කාර්යාලය (UNDRR), ලෝක බැංකුව, ලෝක සෞඛ්‍ය සංවිධානය, රතු කුරුස සංවිධානය, ගෝලීය ආපදා අනතුරු ඇඟවීම් සහ සම්බන්ධීකරණ පද්ධතිය (GDACS).

**ප්‍රාදේශීය පරිපාලන දත්ත:** මහ නගර සභා, රෝහල්, ගිනි නිවන දෙපාර්තමේන්තු සහ සහන ආයතනවල වාර්තා.

**සමීක්ෂණ සහ චන්ද්‍රිකා දත්ත:** දුරස්ථ සංවේදනය, භූගෝලීය සිතියම්කරණය, හානි තක්සේරු කිරීම.

**2. ප්‍රමිතිකරණය සහ වලංගුකරණය:**

**2.1 ජාත්‍යන්තර රාමු සමඟ අනුකූලතාව සහතික කිරීම:**

1. ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ Sendai රාමුව (SFDRR)
2. DesInventar දත්ත ගබඩාව (UNDRR ආපදා පාඩු දත්ත ගබඩාව)
3. EM-DAT (හදිසි සිදුවීම් දත්ත ගබඩාව) CRED
4. ISO 22320:2018 (හදිසි කළමනාකරණය, සිද්ධි ප්‍රතිචාර සඳහා අවශ්‍යතා)

**2.2 ප්‍රධාන ප්‍රමිතිගත දර්ශකවලට ඇතුළත් වනුයේ:**

1. බලපෑමට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව (තුවාල, අවතැන්වීම්, මරණ)
2. ආර්ථික හානි සහ පාඩු (රුපියල් අගය සහ අංක, බලපෑම්වූ යටිතල පහසුකම් පාඩු)
3. බලපෑමට ලක් වූ භූමි ප්‍රදේශය (බලපෑමට ලක්වූ ගංවතුර කලාප වල ව.කි.මී. ආදිය)
4. ප්‍රතිචාර කාලය සහ ගෙන ඇති සහන ක්‍රියාමාර්ග

**3. වලංගුකරණය සහ තත්ත්ව පාලනය:**

1. අනුපිටපත් දෝෂ වළක්වා ගැනීම සඳහා බහු නියෝජිතායතන සමඟ දත්ත හරස් පරීක්ෂා කිරීම.
2. හානි සත්‍යාපනය සඳහා GIS සහ දුරස්ථ සංවේදනය භාවිතා කිරීම.
3. ආපදා වර්ගීකරණය (ස්වාභාවික, තාක්ෂණික, ජීව විද්‍යාත්මක) ප්‍රමිතිකරණය කිරීම.
4. ජාතික සහ ජාත්‍යන්තර සංඛ්‍යාන වර්ගීකරණයන් (උදා: SFDRR, UNDRR, හෝ SDG දර්ශක) සමඟ පෙළගැස්වීම සහතික කිරීම.

**4. නිල ආයතන විසින් අනුමත කිරීම:**

1. වලංගු කිරීම සඳහා ජාතික සංඛ්‍යාලේඛන කාර්යාලය (NSO) හෝ ආපදා කළමනාකරණ අධිකාරීන් වෙත දත්ත ඉදිරිපත් කිරීම.
2. නිල දත්ත මුදා හැරීමේ ප්‍රොටෝකෝල සහ නීතිමය රාමු සමග අනුකූල වීම සහතික කිරීම.
3. ජාතික සැලසුම්කරණයට ආපදා දත්ත ඒකාබද්ධ කිරීම සඳහා අමාත්‍යාංශ (උදා. සෞඛ්‍ය පරිසරය යටිතල පහසුකම්) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**5. ප්‍රකාශනය සහ බෙදා හැරීම:**

1. සංඛ්‍යානමය පත්‍රිකා ආපදා අවදානම් ද්වාර සහ ජාත්‍යන්තර දත්ත සමුදායන් හරහා වාර්තා නිකුත් කිරීම.

2. සංඛ්‍යාලේඛන වලට පරිශීලකයන්ට ප්‍රවේශ වීමට විවෘත දත්ත වේදිකා භාවිතා කිරීම.
3. UN SDGs, SFDRR සහ NDCs සමඟ වාර්තා පෙළගස්වන්න

**6. වරින් වර යාවත්කාලීන කිරීම් සහ වැඩිදියුණු කිරීම:**

1. වේගවත් ප්‍රතිචාරයක් සඳහා තත්‍ය කාලීන ආපදා දැෂා උපකරණ පුවරු නඩත්තු කිරීම.
2. දත්ත නිරවද්‍යතාවය පිරිසිදු කිරීම සඳහා පශ්චාත් ආපදා ඇගයීම් පැවැත්වීම.
3. දත්ත රැස් කිරීම සහ වාර්තා කිරීම වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමවේද නිතිපතා යාවත්කාලීන කිරීම.

රන්ජිත් වීරසේකර - සංඛ්‍යාලේඛන නිලධාරි,
ආපදා කළමනාකරණ අංශය

# *2024 ආපදා සිදුවීම් සාරාංශය*

ආපදාව: නාය යෑම් හා කණ්ඩි කඩාවැටීම

| ඈස්ත්‍රික්කය | බලපෑමට ලක්වූ පවුල් සංඛ්‍යාව | බලපෑමට ලක්වූ පුද්ගලයින් සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | හානි වූ නිවාස | | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි |
|---|---|---|---|---|---|---|
| | | | | පූර්ණ | අර්ධ | |
| කොළඹ | 7 | 28 | 0 | 0 | 7 | 0 |
| ගාල්ල | 76 | 223 | 1 | 0 | 71 | 2 |
| ගම්පහ | 27 | 99 | 0 | 1 | 25 | 1 |
| හම්බන්තොට | 47 | 164 | 0 | 0 | 24 | 0 |
| කළුතර | 205 | 794 | 0 | 1 | 93 | 2 |
| මහනුවර | 438 | 1,748 | 2 | 6 | 303 | 1 |
| කෑගල්ල | 466 | 1,686 | 1 | 1 | 342 | 4 |
| කුරුණෑගල | 46 | 149 | 0 | 0 | 21 | 0 |
| මාතලේ | 11 | 44 | 0 | 1 | 3 | 0 |
| මාතර | 18 | 72 | 0 | 2 | 16 | 0 |
| මොණරාගල | 2 | 8 | 0 | 0 | 2 | 0 |
| නුවර එළිය | 140 | 595 | 0 | 0 | 89 | 0 |
| රත්නපුර | 871 | 3,307 | 2 | 12 | 701 | 21 |
| **එකතුව** | **2,843** | **10,828** | **7** | **24** | **2,103** | **31** |

මූලාශ්‍රය: ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය




ආපදාව: ගංවතුර

| දිස්ත්‍රික්කය | බලපෑමට ලක්වූ පවුල් සංඛ්‍යාව | බලපෑමට ලක්වූ පුද්ගලයින් සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | හානි වූ නිවාස | | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි |
|---|---|---|---|---|---|---|
| | | | | පූර්ණ | අර්ධ | |
| අම්පාර | 91,933 | 312,777 | 3 | 87 | 940 | 189 |
| අනුරාධපුර | 2,479 | 8,060 | 0 | 7 | 32 | 3 |
| බදුල්ල | 360 | 1,309 | 0 | 0 | 6 | 0 |
| මඩකලපුව | 31,591 | 98,807 | 0 | 0 | 174 | 63 |
| කොළඹ | 48,826 | 172,838 | 5 | 118 | 1,217 | 701 |
| ගාල්ල | 6,258 | 22,665 | 4 | 25 | 1,262 | 607 |
| ගම්පහ | 50,772 | 205,560 | 3 | 2 | 256 | 300 |
| හම්බන්තොට | 1,439 | 4,295 | 0 | 0 | 58 | 21 |
| යාපනය | 20,747 | 68,860 | 1 | 2 | 178 | 14 |
| කළුතර | 13,659 | 49,094 | 6 | 20 | 1,494 | 241 |
| මහනුවර | 79 | 337 | 0 | 0 | 34 | 0 |
| කෑගල්ල | 758 | 3,200 | 1 | 0 | 743 | 200 |
| කිලිනොච්චිය | 4,795 | 14,952 | 0 | 0 | 29 | 2 |
| කුරුණෑගල | 2,036 | 6,696 | 2 | 0 | 36 | 5 |
| මන්නාරම | 20,261 | 69,012 | 0 | 0 | 39 | 0 |
| මාතලේ | 42 | 151 | 0 | 0 | 0 | 0 |
| මාතර | 15,527 | 58,757 | 7 | 21 | 1,269 | 533 |
| මොණරාගල | 85 | 350 | 1 | 0 | 58 | 2 |
| මුලතිවු | 3,099 | 9,398 | 0 | 1 | 61 | 12 |
| නුවර එළිය | 79 | 295 | 0 | 0 | 61 | 0 |
| පොළොන්නරුව | 1,227 | 4,124 | 0 | 6 | 65 | 4 |
| පුත්තලම | 35,451 | 127,856 | 5 | 0 | 134 | 34 |
| රත්නපුර | 14,455 | 54,465 | 5 | 24 | 4,454 | 1,350 |
| ත්‍රිකුණාමලය | 4,134 | 12,141 | 1 | 1 | 51 | 0 |
| වවුනියාව | 1,014 | 3,433 | 1 | 0 | 52 | 2 |
| **එකතුව** | **371,106** | **1,309,432** | **45** | **314** | **12,703** | **4,283** |

මූලාශ්‍රය: ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය







ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
විද්‍යා මාවත, කොළඹ 07
දුරකථනය : +94112665258,
ෆැක්ස් : +94112665702,
විද්‍යුත් තැපැල : sahana.ndrsc@gmail.com